සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

11 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:...........................................................................................................

උපදෙස්

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. ........................................ පෘථිවි පද්ධතියේ මානව ක්‍රියාකාරකම් බහුලව සිදුවන කලාපයයි.
(වායු ගෝලය, ජල ගෝලය, ශිලා ගෝලය)

02. පයාගල, මට්ටක්කුලිය, මිරිස්ස යන ස්ථානවල පිහිටි කර්මාන්තය ........................................ යි.
(පෙට්‍රෝ රසායන කර්මාන්තය, විදුලිත් කර්මාන්තය, බෝට්ටු කර්මාන්තය)

03. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ කර්මාන්ත ශාලාවක් ........................................ පිහිටා ඇත.
(කඩවත, බියගම, සපුගස්කන්ද)

04. ලෝක ආකෘති සිතියමේ ජාත්‍යන්තර දින රේඛාව ........................................ සමුද්‍ර සන්ධිය හරහා දිව යයි.
(බීරිං, මලක්කා, ජිබ්‍රෝල්ටා)

05. ........................................ අමු ද්‍රව්‍ය ආනයන කර නිෂ්පාදන සිදු කිරීමේ පදනම මත කාර්මික කලාප ස්ථාපිත කර ඇත. (ඇමරිකාව, ජපානය, ඉන්දියාව)

06. 1:50,000 භූ ලක්ෂණ සිතියම් වල රේඛීය පරිමාණය ........................................ සඳහන් වේ.
(ඇතුළු මායිමේ, ඉහළ වම තීරුවේ, පහළ වම තීරුවේ)

07. ලෝකයේ මුළු ජන සංඛ්‍යාවෙන් ........................................ ක් ආසියා හා අප්‍රිකා මහාද්වීපවල වාසය කරති.
(24%, 76%, 86%)

08. ........................................ මිනිසා නිරායාසයෙන් ලබා ගන්නා ස්වභාවික සම්පතකි.
(හිරු එළිය, වාරි ජලය, ඛණිජ සම්පත්)

09. මව් පාෂාණය ජීර්ණය වීමෙන් හා ඓන්ද්‍රිය ද්‍රව්‍ය එක් වීමෙන් ........................................ නිර්මාණය වේ.
(ඛණිජ, වැලි, පස)

10. අප්‍රිකානු මහාද්වීප තටකය තුළ ........................................ දූපත පිහිටා ඇත.
(තස්මේනියාව, හිස්පැනියෝලා, මැඩගස්කර)

- අංක 11 සිට 15 දක්වා ඇති එක් එක් ප්‍රකාශ කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.

11. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෘෂි කර්මාන්තයේ අස්වැන්න කෙරෙහි සෘජුවම බලපෑමක් ඇති කරයි. නි / වැ

12. දකුණු ආසියාවේ රටවල ජන සංඛ්‍යාව අනුව සසඳා බලන විට ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව විශාලත්වයෙන් පස්වැනි ස්ථානය හිමිකර ගනී. නි / වැ

13. "හෙක්ලා ගිනි කන්ද" ග්‍රීන්ලන්තයේ පිහිටා ඇත. නි / වැ

14. 1: 50.000 භූ ලක්ෂණ සිතියම් වල භෞතික හා සංස්කෘතික ලක්ෂණ දක්වනු ලැබේ. නි / වැ

15. ශ්‍රී ලංකාවේ බහුලව ඇතිවන ස්වභාවික ආපදාව වන්නේ නාය යෑමය. නි / වැ



EXAMRESULTS.LK

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල A හා B වශයෙන් තීරු දෙකකි. ඒවායේ සම්බන්ධතාවය අනුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| | A | B |
|---|---|---|
| 16. | (1). කුැකටෝවා | (A) ඉතාලිය |
| | (2). විසුවියස් | (B) අයිස්ලන්තය |
| | (3). පිනාටුබෝ | (C) පිලිපීනය |
| | | (D) ඉන්දුනීසියාව |

i. ABC ii. BAD iii. DCB iv. DAC (..........)

| | A | B |
|---|---|---|
| 17. | (1). තෙත් කලාපයට ආවේණික පසකි. | (A) රතු දුඹුරු පස |
| | (2) පහත රට තෙත් කලාපීය ප්‍රදේශවල ඇත. | (B). චූර්ණමය නොවූ දුඹුරු පස |
| | (3). වියළි කලාපයට සීමා වී ඇත. | (C). රතු දුඹුරු ලැටසෝල් පස |
| | | (D) රතු කහ පොඩ්සෝල් පස |

i. ADB ii. CDA iii. DCA iv. DBA (..........)

18. ශ්‍රී ලංකාවේ ස්වභාවික ආපදා කීපයක් A තීරුවේ ද ආපදාවට ලක්වන දිස්ත්‍රික්ක B තීරුවේ ද සටහන් වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ

| A | B |
|---|---|
| (1).නියඟය | (A). මහනුවර |
| (2).නායයාම් | (B). කුරුණෑගල |
| (3).ගංවතුර | (C). අම්පාර |
| | (D). කළුතර |

i. BAD ii. BDA iii. CBA iv. DBA (..........)

19 .A තීරුවේ ලංකාවේ වගා කරන බෝග වර්ගද B තීරුවේ ඒවාට උචිත පාංශු වර්ග ද දක්වා ඇත. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| (1). තේ | (A) දියලු පස |
| (2). රබර් | (B) කබොක් මිශ්‍ර රතු පස |
| (3). පොල් | (C) ලොම් හා ලැටරයිට් පස |
| | (D) ලුණු මිශ්‍ර වැලි පස |

i. ACD ii. CBD iii. CAB iv. DAB (..........)

20. ලෝකයේ සුළි සුළං ඇතිවන ප්‍රදේශ A තීරුවේ ද ඒවා හඳුන්වනු ලබන විවිධ නම් B තීරුවේ ද සඳහන් වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| (1). පිලිපීන දූපත් ආශ්‍රිතව | (A) හරිකේන් |
| (2). උතුරු අත්ලන්තික් සාගරය | (B) විලිවිලිස් |
| (3). වයඹ දිග ඕස්ට්‍රේලියාව | (C) ටයිෆූන් |
| | (D) බැගියෝ |

i. ABC ii. CAB iii. DCB iv. DAB (..........)

● ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

21. ශ්‍රී ලංකාවේ පළමුවෙන්ම වර්ෂ .................. දී ජන සංගණනයක් පවත්වන ලදී.


22. සාගර පත්ලේ සිදුවන ........................ සුනාමි ඇතිවීමට බලපාන ප්‍රධාන සාධකයයි.

23. ඛනිජ තෙල් පිරිපහදුවේ දී ඉතිරි වන ද්‍රව්‍ය යොදා ගෙන ........................................ කර්මාන්තය සිදු කරයි.

24. ආදර්ශ ගෝලයේ උතුරු අක්ෂාංශ 23 $2/1_0$ .................................. නිවර්තනය ලෙස හඳුන්වයි.

25. සුළු ආයෝජනයක් සහිත ව, බොහෝ විට පවුලේ ශ්‍රමය යොදා ගෙන නිවස තුළ ........................ කර්මාන්ත සිදුකරයි.

● අංක 26 සිට 28 දක්වා ප්‍රශ්න වලට ලබා දී ඇති ජන සංඛ්‍යාවේ වාර්ෂික වර්ධන අනුපාතය දක්වන ප්‍රස්තාර සටහනට අනුව පිළිතුරු සපයන්න.





26. ඉහත ප්‍රස්තාර සටහන අනුව ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහණ වර්ධනයක් දක්වන්නේ .................... වර්ෂයෙන් පසුවය.

27. ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යා වර්ධන අගය .......................... ක් ලෙසට සටහන් ව ඇත.

28. මෙම ප්‍රස්තාරය ...................................... ප්‍රස්තාර වර්ගයට අයත් වේ.

● පහත සටහනට අනුව 29 හා 30 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




29. වෙරළබඩ භූ ලක්ෂණයක් වන "මුහුදු බොක්ක" දක්වන අක්ෂරය වන්නේ ...................... ය.

30. E අක්ෂරයෙන් දක්වා ඇති ප්‍රදේශයේ දක්නට ලැබෙන ජලවහන ලක්ෂණය ........................... නමින් හඳුන්වයි.

● **අංක 31 සිට 40 දක්වා ප්‍රශ්ණ වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

31. ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගතවන කාලය ඉතා අඩු වී වේගයෙන් ලෝක ජන සංඛ්‍යාව වර්ධනය වීම හඳුන්වන්නේ,

1. ජන සංඛ්‍යාව වර්ධනය　　2. ජන සංඛ්‍යා ව්‍යාප්තිය
3. ජන ඝනත්වය　　4. ජන සංඛ්‍යා ස්ඵෝටනය　　(..........)

32. හග්ගල, යාල හා රිටිගල අයත් වන වන රක්ෂිත වන්නේ,

1. ජාතික උද්‍යාන　　2. අභය භූමි
3. දැඩි ස්වභාවික රක්ෂිත　　4. වන රක්ෂිත　　(..........)

33. විද්‍යුත් උපකරණ සෑදීම හා වීදුරු නිෂ්පාදනයට යොදා ගන්නා ඛණිජ වර්ගයක් වන්නේ,

1. මිනිරන්　　2. මැණික්
3. සිලිකා　　4. ඇපටයිට්　　(..........)

34. වතු බෝගයක් වන රබර් වගාව ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් බ්‍රිතාන්‍ය ජාතිකයා වන්නේ,

1. ජේම්ස් ටේලර් 2. හෙන්රි වික්හැම්
3. රොබට් නොක්ස් 4. ආතර් සී. ක්ලාක් (............)

35. ශ්‍රී ලංකාවේ වැඩි ජන ව්‍යාප්තියක් දක්නට ලැබෙන අංශය වන්නේ

1. නාගරික අංශය 2. ග්‍රාමීය අංශය
3. වතු අංශය 4. ගැමි නාගරික අංශය (............)

36. A - කාබොක් මිශ්‍ර රතු පස
B - 27 °c ක පමණ සාමාන්‍ය උෂ්ණත්වය
C- 2000 mm ට වැඩි වර්ෂාපතනය


ඉහත දක්වා ඇති භෞතික සාධක වඩාත් උචිත වන ව්‍යාපාරික බෝග වගාව වන්නේ

1. තේ 2. පොල්
3. රබර් 4. කුරුඳු (............)

37. ශ්‍රී ලංකාවේ '' පීට් ගල් අඟුරු'' නිධියක් පිහිටි ප්‍රදේශය වන්නේ

1. එප්පාවල 2. පරන්තන්
3. බෝගල 4. මුතුරාජවෙල (............)

● **අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත රූප සටහන් උපයෝගී කර ගන්න.**



A B C

38. A රූප සටහනේ දක්වා ඇති ජලවහන රටාව වන්නේ

1. ශාඛීය 2. ජාලාකාර
3. අරීය 4. වලයාකාර (............)

39 .B රූප සටහනේ P ලෙස දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ

1. කඳු වැටිය 2. කොත් කන්ද
3. හුදකලා කන්ද 4. බහිස් කන්ද (............)

40 .C රූප සටහනේ A - B රේඛාව මගින් දක්වන භූ විෂමතා ලක්ෂණය වන්නේ

1. නිම්නය 2. දියබෙත්ම
3. නෙරුව 4. කඳුවැටිය (............)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 11 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව II | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකය:..........................................................................................................................

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි 'අ', 'ආ', සහ 'ඉ' යන කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(I) කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබට ලබා දී ඇති කඩදාසිය භාවිත කරන්න.

(i) සිතියමේ අංක (1) ක් දක්වා ඇත්තේ කුමක් ද?
(මුතුපරය, වැලි පරය, හුණුගල් කලාපය) (ලකුණු 01)

(ii) සිතියමේ අංක (2) න් දක්වා ඇති ප්‍රදේශය වන්නේ කුමක් ද ?
(රක්ෂිත ප්‍රදේශය, වනාන්තර ප්‍රදේශය, ඉඩිකළ ප්‍රදේශය) (ලකුණු 01)

(iii) සිතියමේ අංක (3) න් දක්වා ඇති රේඛාව වන්නේ
(සමෝච්ච රේඛා, සමවර්ෂා රේඛා, සමගැඹුරු රේඛා) (ලකුණු 01)

(iv) සිතියමේ අංක (4) න් දක්වා ඇත්තේ කුමක් ද ?
(දුම්රිය පොළ, දුම්රිය නැවතුම් පොළ, පාලම යටින් පාර) (ලකුණු 01)

(v) ගංගාව දිගේ A සිට B දක්වා විහිදී ඇති පරිපාලන මායිම වන්නේ
(පළාත් මායිම, උප දිසාපති කොට්ඨාස මායිම, ග්‍රාම නිලධාරී මායිම) (ලකුණු 01)

(vi) සිතියමේ බහුලව දක්නට ලැබෙන ව්‍යාපාරික බෝග වගාව වන්නේ
(වී, පොල්, ගෙවතු) (ලකුණු 01)

(vii) සිතියමේ C අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද? (ලකුණු 01)

(viii) සිතියම් ප්‍රදේශයේ උතුර බලා දිවයන ප්‍රධාන මාර්ගයේ පළමු පාලමේ සිට දෙවන පාලම දක්වා වන දුර කොපමණ ද ? (ලකුණු 01)

(ix) සිතියම් ප්‍රදේශය පිළිබඳව ප්‍රකාශ දෙකක් a , b යටතේ දක්වා ඇත. එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් 'නි' යන්නද වැරදි නම් 'වැ' යන්නද පිළිතුරු පත්‍රයේ ඊට හිමි ස්ථානයේ ලියා දක්වන්න.

(a) D චතුරස්‍රය තුළ ඓතිහාසික ස්ථානයක් පිහිටා ඇත. (ලකුණු 01)

(b) සිතියම් ප්‍රදේශය භූ විෂමතා කලාප අනුව මධ්‍යම කඳුකරය ට අයත් ප්‍රදේශය කි. (ලකුණු 01)

(ආ) ඔබට සපයා ඇති ලෝක සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න. එහි නිවැරදි පිළිතුරට අදාල අක්ෂරය යොදන්න.

(i) A B C අක්ෂර වලින් දක්වා ඇති සුළි කුණාටු අතරින් 'ටයිෆුන්' වාසුළිය ක්‍රියාත්මක වන ප්‍රදේශය කුමක් ද?

(ii) D E F අක්ෂර වලින් දක්වන මුහුදු අතරින් බෝල්ටික් මුහුද දක්වන අක්ෂරය කුමක් ද?

(iii) G H I අක්ෂර අතරින් ඇපලාචියන් කඳුවැටිය දක්වන අක්ෂරය කුමක් ද?

(iv) J K L අක්ෂර අතරින් මෝටර්රථ නිෂ්පාදනයට ප්‍රසිද්ධ රටක් වන දකුණු කොරියාව දක්වන අක්ෂරය කුමක් ද?

(v) M N P අක්ෂර අතරින් 2022 ජනවාරි මස සුනාමි තත්වයක් ඇති වූ 'ටොංගා දූපත' දක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 1 X 5 = 05)

(ඉ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව ඇති තීරුව යොදා ගන්න. එහි නිවැරදි පිළිතුරට අදාල අක්ෂරය යොදන්න.

(i) A B C අක්ෂර අතරින් ඉල්මනයිට් නැමැති ඛනිජ වැලි වර්ගය සඳහා ප්‍රසිද්ධ පුල්මුඩේ දක්වන අක්ෂරය වන්නේ,

(ii) D E F අක්ෂර අතරින් ශ්‍රී ලංකාවේ නියඟ ආපදාවට නිරතුරුව ලක්වන පොලොන්නරුව දිස්ත්‍රික්කය දක්වෙන අක්ෂරය වන්නේ,

(iii) G H I අක්ෂර අතරින් "කල්පිටිය" ධීවර වරාය දක්වන අක්ෂරය වන්නේ,


(iv) J K L අක්ෂර අතරින් සූර්ය විදුලි බලාගාරයක් වන " බරුත කන්ද" දක්වන අක්ෂරය වන්නේ,

(v) M N P අක්ෂර අතරින් අභය භූමියක් වන විල්පත්තුව දක්වන අක්ෂරය වන්නේ,

(ලකුණු 1 X 5 = 05)

## II කොටස

02. පහත දක්වා ඇත්තේ ගෝලීය ජල ව්‍යාප්තිය දක්වන සටහනකි.




(i) ඉහත ජල ව්‍යාප්ති සටහනට අනුව

(a) ග්ලැසියර් හා අයිස් තලවල තැන්පත් ව ඇති ජලය දක්වන අක්ෂරය කුමක් ද?

(b) පහසුවෙන් ලබාගත හැකි මිරිදිය ජලය දක්වන අක්ෂර ය ලියන්න. (ලකුණු 02)

(ii) (a) වර්තමානයේ වඩාත් දූෂණයට ලක් වන්නේ කවර ජල කොටස ද? (ලකුණු 01)

(b) එම කොටස දූෂණය වීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) සම්පතක් ලෙස ජලයේ ඇති ප්‍රයෝජන තුනක් නම් කර ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

03. (i). ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය

(a) ජෛව සාධකයක් ද (ලකුණු 01)

(b) අජෛව සාධකයක් ද නම් කරන්න. (ලකුණු 01)

(ii) (a) ප්‍රධාන භූ තැටි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාව අයත්වන භූ තැටිය නම් කරන්න. (ලකුණු 01)

(iii) (a) ජෛව ගෝලයේ සීමාවන් ලියන්න. (ලකුණු 03)

(b) ජෛව ගෝලයේ පැවැත්මට බලපෑම් කරන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)


04. (i) එකලස් කිරීමේ කර්මාන්තයක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව දැකිය හැකි නව ප්‍රවණතා තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) "ලෝකයේ නැව් නිෂ්පාදන කර්මාන්තයට මුල් කාලීනව සංවර්ධිත රටවල් පමණක් යොමු විය" ඊට බලපෑ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) "වර්තමානය වන විට චීනය, දකුණු කොරියාව, ජපානය වැනි රටවල් නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් බවට පත්ව තිබේ." මේ සඳහා බලපෑ හේතු තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 03)

05. සිතියමේ දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ තේ මිල දී ගන්නා රටවල්ය.





(i) ඉහත සිතියමේ A හා B රටවල් නම් කරන්න. (ලකුණු 02)

(ii) තේ වගාවට අවශ්‍ය භෞතික සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ තේ වගාව වැඩි දියුණු කිරීමට පිහිටුවා ඇති ආයතන දෙකක් ලියන්න. (ලකුණු 02)

(b) තේ වගාව දියුණු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 03)

06. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ වනාන්තර ව්‍යාප්තිය දක්වන සිතියමකි.




(i) A හා B වලට අයත් වන වනාන්තර වර්ග නම් කරන්න. (ලකුණු 02)

(ii) විශේෂිත වනාන්තර පරිසර පද්ධතියක් වන කඩොලාන වල දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) D හා E වනාන්තර කලාප නම් කරන්න. (ලකුණු 02)

(b) D වනාන්තර කලාපයේ දැකිය හැකි ලක්ෂණ දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 03)

07. A - ඔරලෝසු බෙයාරින්

B - පැන්සල් කූරු

(i) ඉහත A හා B නිෂ්පාදන සඳහා භාවිතයට ගන්නා ඛනිජ වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) ඛනිජයක් යනු කුමක් ද ? (ලකුණු 01)

(b) ඛනිජ සම්පත් බෙදනු ලබන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(iii) ඛනිජ සම්පත් භාවිතයේ දී මුහුණ පාන ගැටලු තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

08. පහත දැක්වෙන්නේ ස්වභාවික උපද්‍රව කිහිපයකි.

- භූමිකම්පා
- නායයෑම්
- අකුණු සැර
- වසංගත රෝග

(i) ඉහත ස්වභාවික උපද්‍රව අතරින්,

(a) දේශගුණික උපද්‍රවයක් ලියන්න.

(b) ජීව විද්‍යාත්මක උපද්‍රවයක් ලියන්න . (ලකුණු 02)

(ii) (a) COVID - 19 වසංගතය පළමු වරට ආරම්භ වූයේ චීනයේ කවර නගරයකින් ද ? (ලකුණු 01)

(b) COVID - 19 ගෝලීය වසංගතය නිසා ජනතාවට මුහුණ පෑමට සිදුවන ගැටළු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) (a) ලෝකයේ සුනාමි බලපෑම් බහුලව සිදුවන ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු02)

(b) සුනාමි රළ ඇති වීමට බලපාන සාධක දෙකක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved


**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 11 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව II | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකය:...............................................................................................................................



## භූගෝල විද්‍යාව - II

(01) ප්‍රශ්නයේ 'අ' 'ආ' සහ 'ඉ' යන කොටස්වලට පිළිතරු සැපයීම සඳහා මෙම පත්‍රය භාවිතා කරන්න.

(ආ) (i) ..........

(ii) ..........

(iii) ..........

(iv) ..........

(v) ..........

(vi) ..........

(vii) ..........


(viii) ..........

(ix) (a) ..........

(b) ..........


10

(ඈ)




(i)
(ii)
(iii)
(iv)
(v)
/5

(ඉ)




(i)
(ii)
(iii)
(iv)
(v)
/5

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

11 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව I

පිළිතුරු පත්‍රය

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 1. ශිලා ගෝලය | 11. නි | 21. 1871 | 31. ජන සංඛ්‍යා සංචෝටනය |
| 2. බෝට්ටු කර්මාන්තය | 12. නි | 22. භූමිකම්පා | 32. දැඩි ස්වභාවික රක්ෂිත |
| 3. සපුගස්කන්ද | 13. වැ | 23. පෙට්‍රෝරසායන | 33. සිලිකා |
| 4. බීරිං | 14. නි | 24. කර්කටක | 34. හෙන්රි වික්හැම් |
| 5. ජපානය | 15. වැ | 25. ගෘහ | 35. ග්‍රාමීය අංශය |
| 6. පහල වට තීරුවේ | 16. D A C | 26. 1950 | 36. රබර් |
| 7. 76 % | 17. C D A | 27. 0.7 | 37. මුතුරාජවෙල |
| 8. හිරු එළිය | 18. B A D | 28. සරල රේඛා | 38. වලයාකාර |
| 9. පස | 19. C B D | 29. A | 39. හුදකලා කන්ද |
| 10. මැඩගස්කරය | 20. D A B | 30. ගං දගරය | 40. නිම්නය |

(1X 40 = 40)

## II පත්‍රය

### I කොටස

(01) (අ)

i. වැලිපරය
ii. ඉදිකළ ප්‍රදේශය
iii. සම ගැඹුරු රේඛා
iv. දුම්රිය පොළ
v. උප දිසාපති කොට්ඨාස මායිම
vi. පොල්
vii. බැම්ම / වැව් බැම්ම
viii. 1 km / 1.5 km
ix. (a ) නි
(b ) වැ (ලකුණු 10)

(ආ) i. B ii. E iii. H iv.. J v. P

(1 X 5 = 5)

(ඉ) i. B ii. D iii. G iv. K v. M

(1 X 5 = 5)

### II කොටස

(2). i. (a) B ( b) C (ලකුණු 02)

ii. (a) D (ලකුණු 1)

(b) කැලි කසල ජලයට දැමීම
මල අපද්‍රව්‍ය ජලයට දැමීම
කෘෂි රසායන ද්‍රව්‍ය ජලයට දැමීම (ලකුණු 02)

iii. * ප්‍රවාහනය
* ජලවිදුලිය නිපදවීම
* විනෝදාත්මක කටයුතු සඳහා
* කෘෂිකර්මාන්තය
* දෛනික කටයුතු සඳහා
* ධීවර කර්මාන්තය සඳහා

(කරුණු 3 ට ලකුණු 03, විස්තරයට ල. 02)

(03). i. (a ) ශාක, සතුන්, වියෝජකයන් (ලකුණු 01)

(b) සූර්යාලෝකය, පස, ජලය, දේශගුණය (ලකුණු 01)

ii. (a) අප්‍රිකානු, දකුණු ඇමරිකානු, උතුරු ඇමරිකානු, යුරේෂියානු, ඉන්දු - ඕස්ට්‍රේලියානු, පැසිපික්, ඇන්ටාටික් තැටි (ලකුණු 02)

(b) ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය (ලකුණු 01)

iii. (a) ශිලා ගෝලය - ශාකවල මුල් විහිදෙන හා පාංශු ජීවීන් වෙසෙන කොටස, පස තුළට 2.5 m ක් පමණ දුරට

ජල ගෝලය - ප්‍රභාසංශ්ලේෂණය සඳහා අවශ්‍ය හිරු එළිය ලැබෙන සාගර පතුල් සීමාව

වායු ගෝලය - පක්ෂීන් පියාසර කරන සීමාව , 500 m ක් පමණ උස සීමාව

(ලකුණු 03)

(b) * වනාන්තර විනාශ කිරීම
* අවිධිමත් භූමි පරිහරණය
* වායු ගෝලයට අහිතකර වායු වර්ග මුදා හැරීම
* ජෛව පද්ධති විනාශ කිරීම
*සත්ව වාස භූමි විනාශ කිරීම (ලකුණු 02)

(04). i. කිසියම් නිෂ්පාදනයකට අවශ්‍ය ද්‍රව්‍ය විශේෂ ප්‍රාගුණ්‍යයක් යටතේ විවිධ ස්ථානවල හෝ රටවල් වල නිපදවා එම කොටස් එක් ස්ථානයකට රැගෙන විත් භාණ්ඩයක් සකස් කිරීමයි. (ලකුණු 02)

ii. * නවීන තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිත කිරීම ( රොබෝ තාක්ෂණය)
* නිෂ්පාදන බොහෝ විට බහුජාතික සමාගම් සතුවීම
* විවිධ රටවල් ඒකාබද්ධ වී නිෂ්පාදන එළිදැක්වීම
(ඇමරිකාවේ ජෙනරල් මෝටර්ස්, චීනයේ ෂැංහයි සමාගම)
* අධි සුඛෝපභෝගී මෝටර් රථ නිෂ්පාදනය
* දෙමුහුන් වාහන නිපදවීම (Hybrid)
* පරිසර හිතකාමී මෝටර් රථ නිපදවීම ( සූර්ය බලය) (ලකුණු 03)

iii. (a) කීර්තිනාමය හා පළපුරුද්දක් පැවතීම
විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කළහැකි වීම.
අමුද්‍රව්‍ය ලෙස යකඩ හා වානේ පහසුවෙන් ලබාගත හැකි වීම. (ලකුණු 02)

(b) * නව තාක්ෂණය පැවතීම
* නැව් නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය පුහුණු ශ්‍රමය හා ලාභදායි ශ්‍රමය පැවතීම
* නැව් තටාක සඳහා ජලය නොසිඳෙන ගැඹුරු කඩතොළු සහිත මුහුදු ප්‍රදේශ පැවතීම.

(ලකුණු 03)

(05). i. A - බ්‍රිතාන්‍යය
b - ජපානය (ලකුණු 02)

ii. 15 ° c - 27 °c දක්වා සාමාන්‍ය උෂ්ණත්වය
1900 mm - 3400 mm දක්වා වර්ෂාපතනයක්, ලෝම් ලැටරයිට් පස
ජලය හොඳින් බැසයන මඳ බෑවුම් ප්‍රදේශ (ලකුණු 03)

iii. (a) * තලවකැලේ තේ පර්යේෂණ ආයතනය
* කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
* ශ්‍රී ලංකා තේ මණ්ඩලය (ලකුණු 02)

(b) අපනයන ආදායමක් ලබා ගත හැකි වීම
රැකියා අවස්ථා ලබා ගත හැකිවීම
වතු ජනතාවගේ ආර්ථික හා සමාජ මට්ටම උසස්වීම
වතු ප්‍රදේශවල යටිතල පහසුකම් වර්ධනය වීම (ලකුණු 03)

(06). i. A - වියළි මිශ්‍ර වනාන්තර B - අතර මැදි සදාහරිත වනාන්තර (ලකුණු 02)

ii. *වායුධර මුල් ජලයෙන් ඉහලට මතුවීම
* කයිරු මුල් හා කරු මුල් පැවතීම
* ජලජ ජීවීන්ගේ අභිජනන වාසස්ථානයක් වීම
* වෙරළ ඛාදනය වළක්වාලීමට උපකාරී වීම
* ගංගා මෝය, කළපු ආශ්‍රිත ව පැවතීම (ලකුණු 03)

iii. (a) D - තෙත් කලාපීය වනාන්තර
E - කටු පඳුරු හා ළඳු කැලෑ (ලකුණු 02)

(b) * වර්ෂය පුරාම ලැබෙන අධික වර්ෂාපතනයක් හා උෂ්නත්වයක් පැවතීම.
* වනාන්තරවල ස්වභාවය ( ස්ථිර ලෙස පැවතීම, ශාක පත්‍ර, ශාකවල උස)

* බහුලව ඇති ශාක වර්ග ( හොර, කීන, ගොඩපර, මිල්ල, මිදෙල්ල)
* ව්‍යාප්තව ඇති ප්‍රදේශ (දෙදියගල, නාකියාදෙණිය, එරත්න) (ලකුණු 03)

(07). i. A- මැණික් B - මිනිරන් (ලකුණු 02)

ii. (a). ස්වභාවික නිර්මාණය වන නියත රසායනික සංයුතියක් හා ස්ඵටික හැඩයක් ඇති ගණ ද්‍රව්‍යයක් ඛණිජ වේ. (ලකුණු 01)

(b) ලෝහමය ඛණිජ, අලෝහමය ඛණිජ (ලකුණු 02)

iii. * ඛණිජ කැනීමට යොදා ගන්නා ඇතැම් තාක්ෂණික ක්‍රම නිසා පරිසරය දූෂණය වීම.
* ගංගා ආශ්‍රිතව වැලිගොඩ දැමීම නිසා ගං ඉවුරු ඛාදනය වීම, ගංගා පිටාර ගැලීම, ලවණ ජලය රට තුළට පැමිණීම
* පතල් කැණීම නිසා නාය යාම් ඇතිවීම
* ජලජ ජීවීන් හා පාංශු ජීවීන් විනාශ වීම
* ජලය පිරුණු වලවල් ආශ්‍රිතව මදුරුවන් මගින් වසංගත රෝග බෝවීම (ලකුණු 05)

(08). i. (a) අකුණු සැර
(b) වසංගත රෝග (ලකුණු 02)

ii. (a) වුහාන් නගරය (ලකුණු 01)
(b) ජන ජීවිතය අඩාල වීම
ජීවිත හානි සිදුවීම
මානසික සෞඛ්‍ය බිඳ වැටීම
ආර්ථිකය අඩපණ වීම (ලකුණු 02)

iii. (a) පැසිපික් සාගරය වටා වූ වෙරළ ප්‍රදේශය
ඉන්දියන් සාගරය හා නැගෙනහිර ඉන්දීය වෙරළ තීරය
කැරිබියානු දූපත් වෙරළ තීරය (ලකුණු 02)

(iii). * සාගර පත්ලේ නායයාම් සිදුවීම
* සාගර පත්ලේ ඇතිවන ගිණිකඳු පිපිරීම්
* සාගර මතට විශාල උල්කාපාත කඩා වැටීම
* විශාල හිම කඳුවල කොටස් සාගරයට කඩා වැටීම
* සාගර තුළ කරනු ලබන ප්‍රබල පිපිරීම් ( න්‍යෂ්ටික අත්හදා බැලීමේ) (ලකුණු 03)